0137
057940
2020/02/18
M2/PR

# කෝලම් සම්ප්‍රදායයෙන් විශද වන නාට්‍ය ලක්ෂණ පිළිබඳ ව භරතමුනි නාට්‍යශාස්ත්‍රය ඇසුරින් විමර්ශනයක්.

ආර්.බුද්ධික රණවීර

**GS/M.Phil/DD/16/122**

නර්තන හා නාට්‍ය කලා පීඨය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨය වෙත දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය.

**2018 අප්‍රේල්**

Main_Library_UVPA
057940



057940

## සාරාංශය

### ප්‍රමුඛ පද

කෝලම් සම්ප්‍රදායය, **නාට්‍යශාස්ත්‍රය**, පූර්ව රංගය, කෝලම් රංගනය, රස සිද්ධාන්තය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බටහිර, නිරිත හා දකුණු පළාත්වල ප්‍රචලිත ව පැවති නාට්‍ය සම්ප්‍රදායයක් කෝලම් නාට්‍ය සම්ප්‍රදායය ලෙස හඳුනා ගැනේ. එය අනෙකුත් නාට්‍ය රීතීන් ගෙන් විශේෂිත වනුයේ වෙස්මුහුණු පැළඳ රංග කාර්යය සිදු කිරීම හේතුවෙනි.

තද් සම්ප්‍රදායයෙහි ආකෘතිය ශාන්තිකර්ම, සොකරි හා නාඩගම් නමින් වන අනෙකුත් සාම්ප්‍රදායික නාට්‍යය ආකෘතීන් හා සමාන්තර ව පවතී. ඒවායින් **නාට්‍යශාස්ත්‍රයේ** සිද්ධාන්ත ද විශද වෙයි. අතීත ශ්‍රී ලංකාවේ නාට්‍යය විෂයය අරභයා **නාට්‍යශාස්ත්‍රයෙහි** බලපෑම පුළුල් ව පැවතීම ද, මෙහි දී වැදගත් වෙයි. පසුකාලීන කෝලම් රංගන හා පිටපත් සැලකීමේ දී නාට්‍යය විෂයයික ශාස්ත්‍රීය දැනුම වෙනුවට පුද්ගල අභිමතයන් අනුව කටයුතු කරනු දක්නට ලැබේ. පැරණි කෝලමෙහි න්‍යාය පසුබිම හඳුනාගැනීම මෙහි දී කාලෝචිත ව්‍යායාමක් වෙයි.

### පර්යේෂණ ක්‍රමවේදය

පුස්තකාල පර්යේෂණය මෙහි දී භාවිත ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වෙයි. පැරණි කෝලම් පිටපත් දක්වන ප්‍රයෝග **නාට්‍යශාස්ත්‍රයෙහි** වන නිර්දේශ සමඟ සංසන්දනය මෙහි දී සිදු විය.

### සාකච්ඡාව

කෝලම් රංගයෙහි ප්‍රධාන ආකෘතිය නාට්‍යාරම්භයත්, කෝලම් රංගයත් ලෙස ප්‍රධාන කොටස් දෙකකින් දැකිය හැකි ය. නාට්‍යාරම්භයේ දී කෝලම ඉතා සූක්ෂම ලෙස **නාට්‍යශාස්ත්‍රයේ** නියමයන් අනුගමනය කරන බව පැහැදිලි වෙයි. භාරතීය විශ්වාස අනුව සිදු කෙරුණු ඉෂ්ට දේවතා වන්දනය, සෙත් පැතීම, නාට්‍ය වස්තුව හැඳින්වීම ආදි නාට්‍යය ප්‍රයෝග කෝලමෙහි ද වෙයි.

පූර්ව රංගය ඉදිරිපත් කිරීමේ දී කෝලම නාඩගම් සම්ප්‍රදායයේ ආකෘතිය අනුගමනය කොට පවතී.

කෝලමෙහි ප්‍රයෝග **නාට්‍යශාස්ත්‍රයෙහි** දැක්වෙන රස සිද්ධාන්තය සමග මැනවින් සැසඳෙයි. මෙහි නාට්‍යධර්මී රීතිය අනුගමනය කරයි. නාට්‍යයෙහි මාතෘන් ලෙස භරතමුනි

දක්වන නාට්‍ය වෘත්තීන් ද කෝලමෙහි මැනවින් නිරූපිත ය. දශරූප විධාන යටතේ දැක්වෙන ප්‍රයෝග 10ක් අතරින් ඊහාමෘග, ව්‍යායෝග, ඩිම, හා භාණ යන ලක්‍ෂණ කෝලම් කතා පුවත් වෙතින් ප්‍රකට වෙයි. අභිනය භාවිතය ද **නාට්‍යශාස්ත්‍ර** නිර්දේශ සමග අනුගත වෙයි. කෝලම එහි දී විශේෂ ප්‍රයෝගයක් ද අනුගමනය කරයි. එනම් වෙස්මුහුණු පැළඳීම මගින් මුහුණෙහි උපාංග භාවිතය වෙනුවට ස්ථාවර භාවයක් වෙස්මුහුණින් ප්‍රකට කොට, පසුබිම් ගායනය හා නර්තනය භාව ප්‍රකාශනයෙහි සූක්‍ෂම කරවීම යි. ඇඳුම් පැළඳුම් පැළඳුම් ආදි වේශෝපචාර ද **නාට්‍යශාස්ත්‍ර** ආභාසය ලබා පවතී. භරතමුනි නාට්‍යයෙහි ලා වැළකී සිටිය යුතු කරුණු ද කෝලමෙහි දක්නට නො ලැබේ.

## නිගමනය

ඉහත කරුණු සැලකීමේ දී කෝලම් සම්ප්‍රදායය ඉතා පුළුල් ලෙස **නාට්‍යශාස්ත්‍රයෙහි** නිර්දේශ අනුගමනය කොට පවතින ආකාරය ප්‍රත්‍යක්‍ෂ වෙයි. ඇතැම් අවස්ථාවක දී ස්වාධීන ව කටයුතු කළ ද, මූලික ආකෘතිය හා ගැටීමක දක්නට නො වේ. එහි දී ලාංකේය අනන්‍යතාව ද, භාරතීය න්‍යාය පසුබිම ද මැනවින් යෝජනය කෙරෙනු දැකිය හැකි ය. ඒ අනුව පැරණි කෝලම ශාස්ත්‍රීය දැනුම් සම්භාරයක අවබෝධයෙන් නිර්මිත වූවක් වෙයි. පසුකාලීන කෝලම වෙතින් මෙම ශාස්ත්‍රීය දැනුම වෙනුවට හුදු සාම්ප්‍රදායික අවබෝධය ප්‍රකට වීම තද් සම්ප්‍රදායයේ අවනතියට හේතු වී ඇති බව ද පැහැදිලි වෙයි.

එම හේතුවෙන් කෝලම ගැමි රංගයක් බවටත්, හාස්‍යය පමණක් ප්‍රකට කරන රංග රීතියක් ලෙසත්, ශාන්තිකර්මවලින් එකතු කර ගත් අංගයන්ගෙන් සැකසුණු රංගයක් බවට දුර්මත පැවතිණි. එය කෝලම් සම්ප්‍රදායයේ නිර්මාණාත්මක වටිනාකම අවතක්සේරුවට ලක්වීමකි. එමෙන් ම වෙනස් වන සමාජය සමග අනුරූප වීමට කෝලමට නොහැකි වූයේ ද, ඉහත කී ශාස්ත්‍ර ඥානය වියැකී යාම හේතුවෙන් බව කිව හැකි ය.

මෙම පසුබිම මත ගොඩනැගුණු මත වාද වන, පාත්‍රයන්ගේ වාචික අභිනය භාවිතය කෝලම සංස්කරණයට භාජන වීමක් බව හඳුනා ගැනුණි. සංවාද මූලික කොට ගත් භූමිකා රාශියක් ද පසුකාලීන ව කෝලමට එකතු විය. කෝලම ගර්භ ශාන්තියක් බවට වූ මත වාද ද සහේතුක ව බැහැර කිරීමට මෙම අධ්‍යයනය ඉවහල් විය.